චක්‍රලේඛ අංක 08/2021

මගේ අංකය : WPCEC/MA01/චක්‍රලේඛ
සමුපකාර සේවක කොමිෂන් සභාව(බ.ප.)
අංක-628, 08 වන මහල,
ජනජයසිටි ගොඩනැගිල්ල
නාවල පාර,
රාජගිරිය,
2021.08.02

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති
දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්,
සණස සමිති,
දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල,
අනෙකුත් ලියාපදිංචි සමුපකාර සමිති සභාපතිවරුන් වෙත,

**<u>සමුපකාර සේවයේ සේවා නියුක්තිය සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාම.</u>**

රාජ්‍ය සේවය සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාමට අදාලව රජය විසින් නිකුත් කර විධිවිධාන සැළකිල්ලට ගනිමින් බස්නාහිර පළාත් සමුපකාර සේවයද 2021.08.03 දින සිට සාමාන්‍ය පරිදි පවත්වාගෙන යා යුතු අතර, සියළුම සමුපකාර සේවකයින් එදින සිට සාමාන්‍ය පරිදි සේවය සඳහා වාර්තා කල යුතු වේ. එහිදී සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුකූලව අදාල සේවා කටයුතු පවත්වාගෙන යාමට වගබලාගත යුතු අතර විශේෂයෙන්ම පහත සෞඛ්‍ය උපදෙස් තරයේ පිළිපැදිය යුතුය.

(අ) දුරස්ථභාවය ආරක්ෂා කර ගැනීම

(ආ) මුඛ ආවරණ පැලඳීම

(ඇ) දෑත් පිරිසිදු කිරීම.

02 . ඒ අනුව, 2021.08.03 සිට සමිති කාර්ය මණ්ඩලයේ නිවාඩු සම්බන්ධයෙන් සාමාන්‍ය විධිවිධාන පරිදි කටයුතු කල යුතු වේ.

03. යම් සමුපකාර සේවකයකු පවතින තත්ත්වය තුල නිරෝධායන රෙගුලාසි යටතේ නිරෝධායනයට යොමු කර ඇත්නම් හා එසේ නිරෝධායනය සඳහා යොමු කර ඇත්තේ රජයේ නිරෝධායන නීති උල්ලංඝනය කිරීම වෙනුවෙන් වන දඬුවමක් ලෙස නොවන්නේ නම්, එවැනි සේවකයින් සම්බන්ධයෙන් සමුපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛ අංක 4/2021 ප්‍රකාරව කටයුතු කල යුතු වේ.

04. කොවිඩ් -19 වසංගත තත්ත්වය හමුවේ සමුපකාර ක්ෂේත්‍රයේ සේවා නියුක්තිය බාධාවකින් තොරව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් නිකුත් කරන ලද සමුපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛ අංක 05/2021 මෙයින් අවලංගු කරනු ලැබේ.

කොමිෂන් සභාවේ නියමය පරිදි,

එල්.පී.මනෝජා එස්.පතිරණ
ලේකම්, (වැ.බ)
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත

පිටපත් : 01. ලේකම්,පළාත් මාර්ග සමුපකාර අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස
02. සමුපකාර සංවර්ධන කොමසාරිස් (බස්නාහිර පළාත)- කා.දැ.ගැ.ස